පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - නර්තනය

ශ්‍රේණිය - 8

සතිය- 12

Prepared by- ඩයනා පුෂ්පරාණි මිය

කලාප අධ්‍යාපන කාර්යාලය - ඇඹිලිපිටිය

## 1.0 නර්තන නිර්මාණ

### 1.1 පරිසරය ඇසුරු කරගනිමින් නර්තන නිර්මාණය

- **සත්ත්ව චරිත හඳුනා ගැනීම.**

නර්තන මාධ්‍යයෙන් විවිධ සතත්ව චරිත නිරූපණය සඳහා පරිසරයේ දක්නට ලැබෙන සතත්වයන්ගේ හැසිරීම් රටා නිරීක්ෂණය කළ යුතු ව ඇත. අලියා, සිංහයා, අශ්වයා, යන සිවුපා සතුනගේ මෙන'ම මොනරා, කුකුළා, උකුස්සා වැනි දෙපා සහිත සතත්වයින'ගේ හැසිරීම් රටා විවිධත්වයෙන් යුතු වේ. එක් එක් සත්ත්වයන් ගේ ශරීරාංග පිහිටා ඇති ආකාරය මෙම චලනවල විවිධත්වයට හේතු වේ. මේ සඳහා සත්ත්වයන් ගේ සුවිශේෂ ලක්ෂණ නිරීක්ෂණය කිරීම වනෝද්‍යාන, අභයභූමි, අන්තර්ජාල හෝ රූපවාහිනී වැඩසටහන් නැරඹීම මගින් කළ හැකි ය. අලියා, සිංහයා, අශ්වයා, පොළව මත හැසිරීම් රටා දක්වන සිවුපා සත්ත්වයෝ ය. මොනරා, කුකුළා පොළොව හා ඉහළ තලයත් භාවිත කරමින් හැසිරීම් දක්වති. උකුස්සා බොහෝ විට ඉහළ තලයේ හැසිරෙන්නෙකි. ඒ අනුව චලනවල විවිධත්වයක් ද රඳ පවතී. මෙකී විවිධත්වය හඳුනාගැනීම සඳහා නිරීක්ෂණයක යෙදෙන්න. අනතුරු ව පහත වගුව සම්පූර්ණ කරන්න.

